## ආර්ථික සංගණනය - 2013/14

**(කෘෂිකර්මාන්ත, කර්මාන්ත, වෙළඳ හා සේවා පිළිබඳ තොරතුරු රැස් කිරීම )**

**මාධ්‍ය දැනුවත් කිරීමේ වැඩසටහන- 2013.08.22**

**ආර්ථික සංගණනය 2013/14 පිළිබඳ කෙටි හැඳින්වීම**

ශ්‍රී ලංකාවේ 14 වන ජන හා නිවාස සංගණනය 2012 වසරේදී පවත්වන ලදී. සාමාන්‍යයෙන් ජන හා නිවාස සංගණනයක් පැවැත්වීමෙන් පසුව එළඹෙන වසර දෙක තුළ දී පිළිවෙලින් කෘෂිකර්ම සංගණනයක් සහ කර්මාන්ත සංගණනයක් පැවැත්වීම සාමාන්‍ය සම්ප්‍රදායයි. එහෙත් මෙම සංගණනවල දී වෙළඳ හා සේවා අංශ ආවරණය නොවිණි. නමුත් බොහෝ දියුණු රටවල මෙන් මේ වන විට ශ්‍රී ලංකාවේ ද දළ දේශීය නිෂ්පාදිතයට සේවා අංශයේ දායකත්වය අනෙකුත් අංශ එනම් කෘෂිකර්ම හා කර්මාන්ත අංශ අභිබවා ඉදිරියට පැමිණ ඇත. 2012 වර්ෂය සඳහා දෙපාර්මේන්තුව මගින් කරන ලද ගණනය කිරීම්වලට අනුව මේ වන විට කෘෂි කර්මාන්ත, කර්මාන්ත හා සේවා අංශවල දළ දේශීය නිෂ්පාදිතයට දායකත්වය පිළිවෙළින් 11%, 30% සහ 59% ක් වේ.

මෙසේ බොහෝ දියුණු රටවල මෙන් ශ්‍රී ලංකාවේ ද ආර්ථික ක්ෂේත්‍රයේ ඇති වී ඇති ව්‍යුහාත්මක වෙනස්කම් සැලකිල්ලට ගෙන එලෙස කෘෂිකර්ම, කර්මාන්ත ලෙස සංගණන දෙකක් වෙන් වෙන් වශයෙන් නොපවත්වා එම සියළු ක්ෂේත්‍ර ආවරණය වන පරිදි 2013/14 වර්ෂවලදී ආර්ථික සංගණනයක් පැවැත්වීමට අවශ්‍ය සියලු කටයුතු ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් යොදා ඇත.

මෙම සංගණනය මගින් ලබා ගන්නා තොරතුරු රටෙහි කෘෂිකර්ම, කර්මාන්ත, වෙළඳ හා සේවා අංශ වල ඇතිවී තිබෙන ප්‍රගතිය ඇගයීම, එම අංශ වල ඇතිවී තිබෙන ව්‍යුහාත්මක වෙනස්කම් පදනම් කරගෙන එම අංශ සංවර්ධනය කිරීම සඳහා සැලසුම් හා ප්‍රතිපත්ති සකස් කිරීම සහ ඉදිරි සමීක්ෂණ පැවැත්වීම සඳහා අවශ්‍ය වන ආයතන ලැයිස්තුව සකසා ගැනීම ආදිය සඳහා අවශ්‍ය වේ. එමෙන්ම කෘෂිකර්ම, කර්මාන්ත, වෙළඳ හා සේවා අංශවල නියැළි සුළු හා මධ්‍ය පරිමාණ ආයතන පිළිබඳ මෙතෙක් විශාල අඩුපාඩුවක්ව පැවති දත්ත රැස් කිරීම ද මෙහි සුවිශේෂී අරමුණක් වේ.

සංගණන ආඥා පනත අනුව මහජනතාව වෙතින් මෙම තොරතුරු රැස් කරන අතර රජයේ ප්‍රතිපත්ති සම්පාදනයට සහ තීරණ ගැනීමට අවශ්‍ය ජාතික වැදගත්කමකින් යුක්ත දත්ත රටේ සංවර්ධනය වෙනුවෙන් ලබා දීමට මහජනතාව බැඳී සිටී. එමෙන්ම එම තොරතුරු වල රහස්‍යභාවය ආරක්ෂා කිරීමට ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව ද සංගණන ආඥා පනත අනුව බැඳී සිටී. සංගණනයේ රැස්කරන තොරතුරු යොදාගනිමින් පරිපාලන කොට්ඨාස මට්ටමින් පිළියෙළ කරන ලද සංඛ්‍යාති පමණක් ප්‍රකාශයට පත් කරනු ලබයි. පෞද්ගලික මට්ටමේ තොරතුරු කිසිදු අයුරකින් කිසිම ආයතනයකට හෝ පුද්ගලයින්ට අනාවරණය නොකෙරේ.

ආර්ථික සංගණනය අදියර 4 කින් පැවැත්වීමට නියමිතය. පළමුව ශ්‍රී ලංකාවේ සියලුම වතු (අක්කර 20 ට වැඩි ගොවි කාණ්ඩ) 2013 වසරේ ජූලි - අගොස්තු මාසවලදී ලැයිස්තු ගත කරන ලදී. එම අදියර මේ වන විට අවසන් වී ඇත. දෙවන අදියර යටතේ සියලුම කර්මාන්ත, වෙළෙඳ හා සේවා ඒකක මෙම වසරේ ඔක්තොම්බර් නොවැම්බර් මාසවල දී ලැයිස්තු ගත කෙරේ.

අනතුරුව 2014 වසරේ ජනවාරි - මාර්තු මාස තුලදී කෘෂිකර්මාන්තයට අදාළ සියලුම ඒකක පිළිබඳ විස්තරාත්මක තොරතුරු රැස් කෙරෙන අතර එම වසරේම ජූලි - අගෝස්තු කාල පරිච්ඡේදය තුළ කර්මාන්ත, වෙළෙඳ හා සේවා අංශවලින් සංගණනයේ හතරවන අදියර යටතේ විස්තරාත්මක තොරතුරු රැස් කරනු ලැබේ.

ශ්‍රී ලංකාව තුළ පිහිටි සියළුම කෘෂිකාර්මික බිම් ආවරණය වන පරිදිගොවි කාරකයින්, ගොවි කාරකයාගේ ගෘහ කාණ්ඩ පිළිබඳ තොරතුරු, ඉඩම් භාවිතය හා භුක්තිය, ඒ ඒ බෝග යටතේ වගා කොට ඇති බිම් ප්‍රමාණ, මිරිදිය/කිවුල්දිය/කරදිය මත්ස්‍ය වගාව, ආදී විෂයයන්ට අදාල තොරතුරු රැස් කරනු ලබයි.

ආර්ථික සංගණනයේ දී කර්මාන්ත, වෙළඳ හා සේවා ක්ෂේත්‍ර වලට අදාලව කර්මාන්ත, වෙළඳ හෝ සේවා කටයුත්ත පවත්වාගෙන යනු ලබන ආයතන හෝ ගෘහ ඒකක හඳුනා ගැනීමේ මූලික තොරතුරු, පවත්වාගෙන යනු ලබන ආර්ථික කටයුත්තේ ස්වභාවය, ශ්‍රී ලංකාවේ සුළු හා මධ්‍ය පරිමාණ ආයතන හඳුනා ගැනීමට අවශ්‍ය වන සේවයේ නියුතු පුද්ගලයින් සංඛ්‍යාව, පසුගිය වර්ෂයේ වත්කම, පිරිවැටුම, නිමැවුම ආදී තොරතුරුත් ආර්ථික කටයුත්තට ලියාපදිංචි වී ඇති ආකාරය පිලිබඳවත් තොරතුරු රැස් කිරීමට ජන ලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව බලාපොරොත්තු වේ.

ජාතික වැදගත්කමකින් යුත් මෙම සංගණන ක්‍රියාවලියේ දී එය සාර්ථක කර ගැනීමට නම් ආර්ථික කටයුතු පවත්වාගෙන යන පුද්ගලයන්ගෙන් නිවැරදි තොරතුරු ලබා ගත යුතු වේ. තොරතුරු ලබා ගැනීම සඳහා දෙපාර්තමේන්තුව මගින් පත් කරන ලද ගණන් ගන්නා නිලධාරීන් ආර්ථික කටයුතු පවත්වාගෙන යන ඒකක වලට පැමිණෙනු ඇත. මෙහිදී ආර්ථික කටයුතු පවත්වාගෙන යන පුද්ගලයින් සහ ආයතන ගණන් ගන්නා නිලධාරින්ට ස්වෙච්ඡාවෙන් තොරතුරු ලබා දීමට ඉදිරිපත් වන අයුරින් මාධ්‍ය මගින් ඔවුන් දැනුවත් කිරීම තුල නිවැරදි තොරතුරු රැස් කිරීම පහසුවේ. ශ්‍රී ලංකාවේ ප්‍රථම වරට පවත්වන මෙම ආර්ථික සංගණනය සාර්ථක කර ගැනීම සඳහා මාධ්‍ය මගින් සංගණනයේ එක් එක් අදියර සම්බන්ධ පුළුල් ප්‍රචාරයක් ලබා දෙන ලෙස ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව සියළු මාධ්‍ය ආයතන වලින් ඉල්ලා සිටී.

**අධ්‍යක්ෂ ජනරාල්**
**ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව**
**4 සහ 5 වැනි මහල,**
**රොටුන්ඩා ටවර්, අංක 109**
**ගාලු පාර,කොළඹ 03**

**දුරකථන අංක : 011-2147000, 2147050**
**වෙබ් අඩවිය : www.statistics.gov.lk**